**ලෙකෝ ප්‍රොජෙක්ට්ස් (පුද්ගලික) සමාගම - 2022**
**--------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ලෙකෝ ප්‍රොජෙක්ට්ස් (පුද්ගලික) සමාගමේ ("සමාගම") 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 අඛණ්ඩ පැවැත්මට අදාළ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාව**

මාගේ මතය තත්ත්වාගණනය කිරීමෙන් තොරව, මූල්‍ය ප්‍රකාශනවල සටහන් 2.1 වෙත අවධානය යොමු කරවමි.

**1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳාපවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂය | වටිනාකම (රු.) | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ඉන්වෙන්ටරි | මිලියන 11.6 | ඉන්වෙන්ටරි සත්‍යාපන වාර්තා | 2022 දෙසැම්බර් 31 දිනට ඉන්වෙන්ටරි ශේෂය රුපියල් මිලියන 11.6 වන අතර ඉන්වෙන්ටරි අයිතම ලේඛණය අදාල විගණන කටයුතු සඳහා ඔබ වෙත සපයා ඇත. මෙම ඉන්වෙන්ටරි අයිතම අමුද්‍රව්‍ය සහ නිමි විදුලි කණු (ප්‍රමිතිය අසමත්) වලින් සමන්විත අතර ඒවා බණ්ඩාරගම සහ පැලියගොඩ පරිශ්‍රයන්හි ගබඩාකර ඇත. මෙම ද්‍රව්‍ය සත්‍යාපනය කිරීම සඳහා ලෙකෝ ප්‍රොජෙක්ට්ස් සමාගම සතුව සේවක මණ්ඩලයක් සහ වෙනත් ක්‍රමවේදයක් නොමැති නමුදු, නුදුරු අනාගතයේදී අවම වශයෙන් ලංකා විදුලි පෞද්ගලික සමාගමෙහි සේවක මණ්ඩලයේ සහය ලබාගෙන හෝ සත්‍යාපනය කිරීම සඳහා කටයුතු කිරීමට අප පියවර ගන්නෙමු. | 1) වාර්ෂික තොග සත්‍යාපනය සිදු කළ යුතුය.<br>2) ආයතනයේ සම්පත් උපරිම ප්‍රතිලාභ ලබා ගත හැකි ආකාරයෙන් උපයෝජනය කළ යුතුය. |
| (ආ) | දේපළ, පිරියත සහ උපකරණ | මිලියන 5.2 | ස්ථාවර වත්කම් සත්‍යාපන වාර්තා | 2022 දෙසැම්බර් 31 වන දිනට දේපල, පිරියත සහ උපකරණ වල පිරිවැය රුපියල් මිලියන 5.2ක් වන අතර විගණන තොරතුරු සඳහා එක්සෙල් ආකෘතියෙන් යුතු ස්ථාවර වත්කම් ලේඛණය දැනටමත් ඔබ වෙත ලබාදී ඇත. ලිහිලි මෙවලම් (loose tools), පිරියත හා උපකරණ ආදී මෙම වත්කම් බණ්ඩාරගම පරිශ්‍රයේ ගබඩා කර ඇත. අව්වු මලබැඳීමට ලක්ව ඇති අතර වස්කඩුව ගබඩාවෙහි ඉවත දමා ඇත. නිතර සත්‍යාපනය සඳහා ලෙකෝ ප්‍රොජෙක්ට්ස් (පෞද්ගලික ) සමාගම (මින්පසු LPL ලෙස හඳුන්වන) සතුව කාර්ය මණ්ඩලයක් සහ වෙනත් පහසුකම් නොමැති අතර ලෙකෝ වෙනත් කාර්‍ය මණ්ඩලය සහ අවශ්‍ය දේ සමඟ සත්‍යාපනය ආවරණය කිරීම සඳහා අප බලාපොරොත්තු වෙමු. | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකිරීම සඳහා කටයුතු කලයුතුය. |

### 1.6.2 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට දීර්ඝකාලීන වෙලෙඳ සහ වෙනත් ලැබියයුතු ශේෂය රුපියල් මිලියන 9.3 ක් විය. සමාගම රුපියල් මිලියන 1.5 ක් සහ රුපියල් මිලියන 0.3 ක් පිළිවෙලින් ලංකා විදුලිබල මණ්ඩලය (ලං.වි.ම) සහ ලංකා විදුලි පෞද්ගලික සමාගම වෙතින් ලැබිය යුතු ලෙස හඳුනාගෙන ඇතත්, එම ආයතන විසින් ඔවුන්ගේ මූල්‍ය ප්‍රකාශයන්හි ගෙවියයුතු ලෙස වාර්ථාකර නොතිබුණි. | දීර්ඝ කාලයකින් පසුව වුවද ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලැබිය යුතු මුදල් අයකර ගැනීම සඳහා අප උපරිම උත්සහය දරන ලද අතර, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (රත්නපුර- ලංවිම) සමඟ 2022 අගෝස්තු මසදී සාකච්ඡාවක් පවත්වන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ඉදිකරන ලද රුහැන් මැනීම සඳහා ලං.වි.ම එකඟ වන ලදි. | දීර්ඝකාලීන ලැබිය යුතු මුදල් අයකරගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රුපියල් මිලියන 7.5 ක ලාභයක් වූ අතර ඉකුත් වර්ෂයේ එයට අනුරූප පාඩුව රුපියල් මිලියන 0.3 ක් විය. එබැවින් මූල්‍ය ප්‍රතිඵලයෙහි රුපියල් මිලියන 7.8 ක වර්ධනයක් නිරීක්ෂණය කරන ලදී. මෙම වර්ධනයට ප්‍රධානම හේතුව වන්නේ ඝන අපද්‍රව්‍ය කළමණාකරන ව්‍යාපෘතිය මඟින් ලද අදායම, සමාලෝචිත වර්ෂය සඳහා හඳුනාගැනීම වේ.

### 2.2 අනුපාත විශ්ලේෂණය

සමාගමේ ජංගම අනුපාතය ඉකුත් වර්ෂයට සාපේක්ෂව 0.89 සිට 1.25 දක්වා වර්ධනය වී ඇත.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විදුලි කණු නිෂ්පාදනය ලෙකෝ ප්‍රොජෙක්ට්ස් (පුද්ගලික) සමාගමේ එක් ප්‍රධාන ව්‍යාපාරයක් විය. තත්ව පරීක්ෂාව අසමත්වීම හේතුවෙන් 2013 වසරේදී විදුලි කණු නිෂ්පාදනය නවතා දමා ඇත . ඉන්පසු සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කණු වල ගුණත්වය ඉහල නංවමින් නැවත විදුලිකණු නිෂ්පාදනය ඇරඹීම හෝ වෙනත් සුදුසු ව්‍යාපාරයක් හඳුනාගැනීම හෝ සිදුකර නොමැත . තවදුරටත්, 2022 දෙසැම්බර් 31 දිනට සමාගම රුපියල් මිලියන 18.5 ක සමුච්චිත අලාභ වාර්ථාකර ඇත. | ලෙකෝ ආයතනයෙන් පිටත නව ව්‍යාපෘති භාරගැනීමට කළමනාකරණය තීරණය කල අතර 2024 වසරෙහි දී ආරම්භ කිරීම සඳහා ප්‍රධාන ව්‍යාපෘති දෙකක් අප විසින් හඳුනාගෙන ඇත . එමනිසා අප විසින් 2024 වර්ෂය සඳහා අයවැය සහ ක්‍රියාකාරී සැලැස්ම සකස්කර ඇත. | ගුණත්වය ඉහල දමමින් කණු නිෂ්පාදනය නැවත ආරම්භ කිරීමට හෝ වෙනත් සුදුසු ව්‍යාපාරයක් හඳුනාගැනීමට කටයුතු කලයුතුය. |

## 3.2 නිෂ්ක්‍රිය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත සහ උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට දේපළ, පිරියත සහ උපකරණවල පිරිවැය රුපියල් මිලියන 5.2 ක් වූ අතර මෙම වත්කම් සියල්ල 2013 වර්ෂයේ සිට නිෂ්ක්‍රිය වී ඇත. | ලිහිල් මෙවලම් (loose tools), පිරියත හා උපකරණ ආදී මෙම වත්කම් බණ්ඩාගම පරිශ්‍රයේ ගබඩා කර ඇත. අච්චු මලබැඳීමට ලක්ව ඇති අතර වස්කඩුව ගබඩාවෙහි ඉවත දමා ඇත. | සංවිධානයේ සම්පත් උපරිම ප්‍රතිලාභ ලබා ගත හැකි වන පරිදි උපයෝජනය කළ යුතුය. |